# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 9 දරන
# දේශීය ණය හා සංවර්ධන
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 01 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1974 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 9 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 3/67.

දේශීය ණය සහ සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 9 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන දේශීය ණය සහ සංවර්ධන ආඥාපනතෙහි 2 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 404 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (2) කොමසාරිස් මණ්ඩලය යටත් පිරිසෙයින් පස් දෙනකු ගෙන් සමන්විත විය යුතු අතර ඒ සියලු දෙනාම අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය ; තවද—

(අ) ඔවුන්ගෙන් එක් කෙනකු අමාත්‍යාංශයේ ලේකම් විය යුතු අතර, ඔහු එහි සභාපතිවරයා විය යුතු ය ;

(ආ) ඔවුන්ගෙන් තවත් කෙනකු පළාත් පාලන කොම සාරිස්වරයා විය යුතු ය ;

(ඇ) ඔවුන්ගෙන් තවත් කෙනකු වාරිමාර්ග, විදුලිබල හා මහා මාර්ග විෂයය භාර අමාත්‍යවරයා විසින් එම පත් වීම සඳහා නමින් හෝ නිල නාමින් නම් කරනු ලබන රාජ්‍ය නිලධරයකු විය යුතු ය ; තවද

(ඈ) ඔවුන්ගෙන් තවත් කෙනකු මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් එම පත්වීම සඳහා නමින් හෝ නිල නාමින් නම් කරනු ලබන රාජ්‍ය නිලධරයකු විය යුතු ය. " ;

(2) එම වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(3) එම වගන්තියෙහි (4) වන උපවගන්තිය එහි (3) වන උප වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඒ 05140—10,925 (74/4)

"(1) මේ ආඥාපනතෙහි 30 වන වගන්තිය යටතේ පරිවර්තිත යම් ණයක් ද ඇතුළුව ආණ්ඩුව විසින් යම් කිසි තැනැත්තකුට, සමිතියකට හෝ පුද්ගල මණ්ඩලයකට නැතහොත් යම් පළාත් පාලන ආයතනයකට දනට දී ඇති යම් ණයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කොමසාරිස්වරුන්ට පැවරිය හැකි අතර එසේ පවරනු ලැබූ විට, එකී ණය වෙනුවෙන් ගෙවිය යුතු සියලු මුදල්, එසේ පැවරීමට පෙරාතුව එම මුදල ආණ්ඩුවට ගෙවනු ලැබිය යුතු වූයේ යම් නියම හා කොන්දේසි අනුව ද ඒ නියම හා කොන්දේසි අනුව කොමසාරිස්වරුන්ට ගෙවිය යුතු වන්නේ ය. තවද එම මුදල ගෙවන බවට තබන ලද සියලු ඇප, මෙම ආඥාපනත යටතේ වූ ණයක් සම්බන්ධයෙන් තබන ලද ඇප වූයේ නම් ඒවා යටත් කරනු ලබන ආකාරයෙන්ම යටත් කරනු ලැබිය හැකි විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ඒකාබද්ධ අරමුදල, බැංකු ආදියෙන් කොමසාරිස්වරුන්ට ණය ලබා ගත හැකි බව.

6. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙනු ලබන අමාත්‍යවරයාගේ කැමැත්ත ලබා කොමසාරිස්වරුන් විසින්, ආපසු ගෙවීමේ ක්‍රමය හා කාලය ද ණය මුදල වෙනුවෙන් ගෙවිය යුතු පොලිය ද සම්බන්ධයෙන් ඉහත කී ආකාරයේම එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියමයන් පිට—

(අ) ඒකාබද්ධ අරමුදලෙන්; හෝ

(ආ) යම් කිසි වාණිජ බැංකුවකින්; හෝ

(ඇ) ආණ්ඩුවේ අනුග්‍රහය ලත් යම් කිසි ණය දෙන ආයතනයකින්; හෝ

(ඈ) යම් කිසි පළාත් පාලන ආයතනයකින්

ණය ලබාගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබාගන්නා වූ මුළු ණය මුදල, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන සීමාව නොඉක්මවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඉවත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8 වන වගන්තිය සංශෝධනය කිරීම.*

" (ආආ) මේ ආඥාපනත ක්‍රියාත්මක කිරීමෙහි ලා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කොමසාරිස්වරුන් විසින් දරනු ලබන සියලු වියදම් ; ".

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*" ණය දිය හැකි කාර්ය.*

9. කොමසාරිස්වරුන් විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව පහත සඳහන් කාර්ය සඳහා ණය දිය හැකි ය :—

(අ) යම් පළාත් පාලන ආයතනයක් විසින් කරනු ලැබීමට එම ආයතනයට නීතියෙන් බලය පැවරෙන යම් මහජනෝපකාර කටයුත්තක් සඳහා, එකී පළාත් පාලන ආයතනයට ; සහ

(ආ) යම් මහජනෝපකාර කටයුත්තක් සඳහා යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 14 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියෙහි 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*" 1971 අංක 38 දරන මුදල් පනතෙහි විධිවිධාන අදාළ කිරීම.*

14. 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව කොමසාරිස් මණ්ඩලයේ මුදල් පාලනය හා ගණින් හිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ".

9. පහත සඳහන් අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 14 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම ප්‍රඥප්තියෙහි 14අ වන වගන්තිය වශයෙන් එය බලපැවැත්විය යුතු ය :— *14අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.*

*" කොමසාරිස් මණ්ඩලයේ මුදල් වර්ෂය.*

14අ. කොමසාරිස් මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ".

10. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 30 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියෙහි 30 වන වගන්තිය සංශෝධනය කිරීම.*

" (1) මේ ආඥාපනත ආරම්භ වීමට පෙර යම් කිසි පළාත් පාලන ආයතනයකට දෙන ලද්දා වූ ද නිදන් අරමුදලක් මගින් ආපසු ගෙවිය යුතු වූ ද යම් ණයක් මුල් මුදල හා පොලිය වාරික

වලින් ගෙවිය යුතු ණයක් බවට පරිවර්තනය කළ යුතු යයි මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි අතර එවිට එම ණය මුදල ඒ අනුව පරිවර්තනය කරනු ලැබිය යුතු ය. එසේ පරිවර්තනය කරනු ලැබූ විට ඒ ණය මුදල හා ඒ වෙනුවෙන් අය විය යුතු පොලිය ආපසු ගෙවීමේ කාර්යය සඳහා ඒ පරිවර්තනය කිරීමට පෙර තබන ලද ඇපය ඒ පරිවර්තනය කරනු ලැබූ ණය මුදලට සම්බන්ධ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව යටත් කරනු ලැබිය හැකි විය යුතු ය.".

33 වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**11.** පහත සඳහන් අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තිය අගට එකතු කිරීමෙන් එම ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර ප්‍රධාන ප්‍රඥප්තියෙහි 33 වන වගන්තිය වශයෙන් එම වගන්තිය බල පැවැත්විය යුතු ය :—

'අර්ථ නිරූපණය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ ආඥාපනතෙහි—

"අමාත්‍යවරයා" යන්නෙන් පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වන අතර "අමාත්‍යාංශය" යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය;

"අමාත්‍යාංශයේ ලේකම්" යන්නට අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක් ඇතුළත් වන්නේ ය;

"ආණ්ඩුවේ අනුග්‍රහය ලත් ණය දෙන ආයතනය" යන්නෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ කාර්යයන් සඳහා පිළිගන්නා ලද යම් කිසි ණය දෙන ආයතනයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ;

"වාණිජ බැංකුව" යන්නට මුදල් නීති පනතෙහි එම යෙදුමට ඇති අර්ථය ම ඇත.'.